# ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය, කොළඹ

## India-Connects: ආර්ථික හා ව්‍යාපාරික පුවත් ලිපිය

**2016 මැයි - ජූනි**

**<u>ඉන්දියාව හා ශ්‍රී ලංකාව අම්පාර ප්‍රදේශයේ කාන්තාවන් දිරිගැන්වීමේ ව්‍යාපෘතියකට අත්සන් තබයි</u>**

2016 ජූනි 7 වන දින ඉන්දියාව හා ශ්‍රී ලංකාව අම්පාර ප්‍රදේශයේ කාන්තා ප්‍රජා අධ්‍යාපන මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා වන අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබුවේය. ඉන්දීය මහ කොමසාරිස් වයි. කේ. සිංහා මහතා හා කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ ලේකම් චන්ද්‍රානි සේනාරත්න මහත්මිය ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයේදී මෙම අවබෝධතා ගිවිසුමට අත්සන් කළෝය. මෙම උත්සවය සංවිධානය කර තිබුණේ කාන්තා හා ළමා කටයුතු පිළිබඳ ගරු ඇමතිනී කේ. ඩී. එම්. චන්ද්‍රානි බණ්ඩාර විසිනි.

අම්පාර දිස්ත්‍රික්කයේ සිටින යුද්ධයෙන් පීඩාවට පත් වූ හා අඩු ආදායම්ලාභී කාන්තාවන් සඳහා රෙදිපිළි හා කෘෂි නිෂ්පාදන සැකසීම සඳහා අවශ්‍ය දැනුම ලබාදීමට ප්‍රජා අධ්‍යාපන මධ්‍යස්ථානයක් පිහිටුවීම මෙම ව්‍යාපෘතියේ මුඛ්‍ය අරමුණයි. ඉලක්කගත ප්‍රදේශ වල කාන්තාවන් සාමාජීය හා ආර්ථිකමය වශයෙන් සවිබල ගැන්වීම සඳහා ඔවුන්ගේ ජීවන කුසලතාවයන් ඉහළ නැංවීමට මෙම ව්‍යාපෘතිය උපකාරී වේ. ප්‍රධාන පුහුණුවන්නියන් 20 දෙනෙකුටද බිම් මට්ටමේ පුහුණු වන්නියන් 100 දෙනෙකුටද දැනුම ලබා දෙන මෙම ව්‍යාපෘතිය වසර දෙකක් ඇතුළත ක්‍රියාවට නැංවීමට නියමිතය.

ඉන්දීය රජය මේ හා සමාන ව්‍යාපෘතියක් 2010 ජූනි මස සිට මඩකළපුව දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කර ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ මඩකළපුව දිස්ත්‍රික්කයේ යුද්ධයෙන් පීඩාවට පත් වූ හා අඩු ආදායම්ලාභී කාන්තාවන් 1,500කට අධික පිරිසකට ක්ෂේත්‍ර හතක් යටතේ වෘත්තීමය පුහුණුව ලබා දී ඇත. එම වෘත්තීයන් වන්නේ (i) රෙදිපිළි හා ඇඟළුම්; (ii) විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය; (iii) කෘෂි නිෂ්පාදන සැකසීම; (iv) පරිඝනක; (v) ව්‍යවාසකත්ව සංවර්ධනය; (vi) සූර්ය පහන් හා (vii) වැසි ජලය රැස්කිරීම යනාදියයි.

ඉන්දීය රාජ්‍ය නොවන සංවිධානයක් වන SEWA, මෙම ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම සඳහා ඉන්දීය රජය සමඟ අත්වැල් බැඳගෙන තිබේ. එසේම මෙම ව්‍යාපෘතිය කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයේ උපදේශකත්වය මත ක්‍රියාත්මක වේ.

## මධ්‍යම හා ඌව පළාතේ ඉන්දීය නිවාස ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ඉන්දියාව නියෝජිතායතන සමඟ ගිවිසුම් අත්සන් තබයි

ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය, ඉන්දියාව විසින් ක්‍රියාත්මක කරන නිවාස ව්‍යාපෘතිය මධ්‍යම හා ඌව පළාත් තුළ ක්‍රියාවට නැංවීම සඳහා එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහන (UN HABITAT), ශ්‍රී ලංකා රතු කුරුස සංගමයේ සහයෝගීතාවයෙන් ජාත්‍යන්තර රතු කුරුස සංවිධානය හා රතු අඩසඳ සමාජය, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හා මනුෂ්‍යත්වය සඳහා නිවහන (Habitat for Humanity) යන නියෝජිතායතන සමඟ ගිවිසුම් අත්සන් කළේය. වතු කම්කරු නිවාස සමූපාකාර සමිති හා ප්‍රතිලාභීන්ගේ දායකත්වය සහිත නිර්මාණශීලී ප්‍රජා-මූලික ආකෘතියක් මගින් නිවාස 4,000ක් තැනීමට මෙම ව්‍යාපෘතිය මගින් අරමුණු කෙරේ. සමස්ත ව්‍යාපෘතිය මගින් ඉදිකිරීමට අදහස් කෙරෙන නිවාස සංඛ්‍යාව 50,000 කි.

ගිවිසුම් සඳහා අත්සන් තැබීමේ උත්සවය කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් රන්ජිනී නඩරාජපිල්ලෙයි මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවතිණ. මෙම අවස්ථාවට කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයේ හා වැවිලි කර්මාන්ත මානව සංවර්ධන භාරයේ නිලධරීන්ද එක් විය.

## ඉන්දීය ඛනිජ තෙල් හා ස්වභාවික ගෑස් අමාත්‍යාංශ නියෝජිතයන්ගේ ශ්‍රී ලංකා සංචාරය

අන්තර් ජාතික සහයෝගීතාවය පිළිබඳ සම ලේකම් ශ්‍රී සංජේ සුධීර් මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් ඉන්දීය නියෝජිත කණ්ඩායමක් මැයි 19 හා 20 දෙදින තුළ ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය. මෙම කණ්ඩායම IOCL, OVL, EIL, GAIL, හා Petronet LNG Ltd (PLL) යන ආයතනයන්හි නියෝජිතයන්ගෙන් සමන්විත විය. මෙම සංචාරයේදී ඉන්දීය නියෝජිතයන් ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍ය ගරු චන්ද්‍රිම වීරක්කොඩි, සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය ගරු මලික් සමරවික්‍රම හා අග්‍රාමාත්‍ය ජ්‍යේෂ්ඨ උපදේශක ආර්. පාස්කරලිංගම් යන මහත්වරුන් සමඟ සාකච්ඡා පැවැත්වීය. එසේම මෙම කණ්ඩායම 2016 මැයි 20 වන දින ත්‍රිකුණාමලයේ ඉහළ හා පහළ තෙල් ටැංකි පර්යන්ත නැරඹීමට ත්‍රිකුණාමලයේ සංචාරයකද නිරත විය.

- **<u>ඉන්දු-ශ්‍රී ලංකා ද්විපාර්ශවීය වෙළඳාම</u>**

2016 ජනවාරි - ජූනි කාලසීමාව තුළ ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර ද්විපාර්ශවීය වෙළඳාම ආසන්න ලෙස ඇමරිකානු ඩොලර් බිලියන 2.05 ක් දක්වා වර්ධනය විය. මෙම කාලසීමාව තුළ ශ්‍රී ලංකාව විසින් ඉන්දියාවට කරනු ලැබූ අපනයනයන්ගේ වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන 263.98ක් පමණ වූ අතර ඉන්දීය ආනයනයන්ගේ වටිනාකම ආසන්න ලෙස ඇමරිකානු ඩොලර් මිලියන 1,790.66ක් පමණ විය. 2016 ජූනි මාසයේදී ඉන්දියාව වෙත යවනු ලැබූ ශ්‍රී ලංකා අපනයනයන්ගේ වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන 46.77ක් පමණ වූ අතර ඉන්දියාවෙන් ගෙන්වනු ලැබූ ආනයනයන්ගේ වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන 286.58ක් පමණ විය. ශ්‍රී ලංකාවේ ගෝලීය ආනයන හා අපනයන සඳහා ඉන්දියාවේ දායකත්වය පිළිවෙළින් 18.01%ක් හා 5.29%ක් විය.

**මූලාශ්‍රය:** ශ්‍රී ලංකා රේගුව, www.customs.gov.lk

- **<u>ඉන්දීය සංචාරකයන්ගේ පැමිණීම්</u>**

2016 ජනවාරි - ජූනි කාලසීමාව තුළ ඉන්දියාවෙන් ශ්‍රී ලංකාවට පැමිණි මුළු සංචාරකයින් ගණන 172,841 ක් විය. එය ශ්‍රී ලංකාවේ සමස්ත සංචාරක පැමිණීම් වලින් 17.92%කි. 2015 ජූනි මාසය තුළ ශ්‍රී ලංකාවට පැමිණි ඉන්දීය සංචාරකයින් ගණන වන 25,860 ට සාපේක්ෂව 2016 ජූනි මාසය තුළ ඉන්දීය සංචාරකයන් 27,068 ක් පැමිණියේ 4.7%ක වර්ධනයක් සටහන් කරමිනි. සංචාරක සංවර්ධන අධිකාරියේ සංඛ්‍යා ලේඛන අනුව 2016 ජූනි මාසයේදී වැඩිම සංචාරකයින් ප්‍රමාණයක් පැමිණ ඇත්තේ ඉන්දියාවෙන් (27,068) වන අතර ඉන් අනතුරුව ඉහළම සංචාරකයින් පිරිසක් පැමිණි රටවල් වන්නේ චීනය (19,952), එක්සත් රාජධානිය (9,406) හා ජර්මනිය (5,461) යි.

**මූලාශ්‍රය:** ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන මණ්ඩලය, www.sltda.gov.lk

# <u>ඉන්දියාවේ ප්‍රධාන පුවත්</u>

- 2017 මූල්‍ය වර්ෂය තුළ ඉන්දියාවේ ආර්ථික වර්ධන වේගය 7.5%ක් වේ යැයි ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පුරෝකථනය කරයි.

- ඉන්දියාව ලොව විශාලතම කොහුබත් නිෂ්පාදකයා වේ.

- 2015 සැප්තැම්බර් හා 2016 පෙබරවාරි අතර කාලසීමාව තුළ ඉන්දීය දුම්රිය මාර්ග පද්ධතිය ආකර්ෂණය කරගෙන ඇති සෘජු විදේශ ආයෝජන ප්‍රමාණය ඇමරිකානු ඩොලර් මිලියන 59.81 කි.

- ෆෝඩ් මෝටර් සමාගම නව ගෝලීය තාක්ෂණ හා ව්‍යාපාරික මධ්‍යස්ථානයක් චෙන්නායි නගරයේ ස්ථාපිත කිරීමට සැලසුම් කරයි.

- ඉන්දියාව හා කොරියාව වරාය සංවර්ධන ගිවිසුමකට අත්සන් තබයි.

- ඉන්දියාව හා ජපානය විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ සබඳතා තවදුරටත් ශක්තිමත් කිරීමට සැරසෙයි.

- ඉන්දියාව පුනර්ජනනීය බලය පිළිබඳ රටෙහි ආකර්ෂණීයත්වය දක්වෙන දර්ශකයේ (RECAI) තෙවන ස්ථානයට පත් වේ.

- ඉන්දියාවේ සූර්ය බල ව්‍යාපෘතිය සඳහා ලෝක බැංකුව ඇමරිකානු ඩොලර් මිලියන 625ක ණය මුදලක් අනුමත කරයි.

- ඉන්දියාවේ ආර්ථික වර්ධන වේගය 2019 වර්ෂයේදී 8% දක්වා ඉහළ යනු ඇතැයි ෆිච් (Fitch) ආයතනය ප්‍රකාශ කරයි.

- ඉන්ටෙල් ඉන්ඩියා (Intel India) සමාගම දුෂ්කර ප්‍රදේශවල ඩිජිටල් අධ්‍යාපන මධ්‍යස්ථාන 100ක් පිහිටුවීම සඳහා ඉන්දීය රජය සමඟ අත්වැල් බැඳ ගනී.

- ඉන්දීය රජය ඉදිරි වසර පහ තුළ අවම වශයෙන් සූර්ය, සුළං හා ජෛව ඉන්ධන බලශක්ති ව්‍යාපෘති 10,000ක් ඇරඹීමට ඉලක්ක කරයි.

**මූලාශ්‍රයඃ** *http://indiainbusiness.nic.in*